# පුනරීක්ෂණ

3.1
- රජය විසින් ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන ආකාරය නිදසුන් දෙකක් ඇසුරෙන් දක්වන්න.

3.2
- රජයක ආර්ථික අරමුණු හතරක් මොනවාද?
- ව්‍යාපාර හා රජය අතර ඇති අන්තර් සම්බන්ධතාවයේ ඇති වැදගත්කම කුමක්දැයි පැහැදිලි කරන්න.

3.3
- රජයේ අයවැය ප්‍රතිපත්තිය හා මූල්‍ය ප්‍රතිපත්තිය හඳුන්වන්න.
- රජයක් විසින් පනවන විවිධ බදු නිසා ව්‍යාපාර කෙරෙහි ඇති කරන විවිධ බලපෑම් හතරක් දක්වන්න.

3.4
- රටේ මුදල් සැපයුම පාලනය කිරීම සඳහා මහ බැංකුව භාවිතා කරන ප්‍රධාන පොළී අනුපාතික මොනවාද දක්වන්න.
- ගුණාත්මක ණය පාලනය යනු කුමක්දැයි හඳුන්වා ඒ සඳහා උදාහරණ දෙකක් දක්වන්න.

3.5
- පාරිභෝගික ආරක්ෂණය යන්න හඳුන්වන්න.
- වර්තමානයේදී පාරිභෝගික ආරක්ෂණය වඩා වැදගත් වීමට හේතු මොනවාද?
- පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට සහ ව්‍යාපාරිකයාට ඇති වාසි හතර බැගින් වෙන වෙනම දක්වන්න.

3.6
- පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රජයේ ආයතන හයක් දක්වන්න.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යයන් හතරක් දක්වන්න.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යයන් හතරක් දක්වන්න.
- SLS සහතිකය අනිවාර්යයෙන් ලබා ගත යුතු යැයි පාරිභෝගික ආරක්ෂණ අධිකාරි පනත නියම කර ඇති භාණ්ඩ වර්ග හයක් නම් කරන්න.
- SLS සහතිකය ලබා ගැනීමෙන් නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ලැබෙන වාසි හතර බැගින් දක්වන්න.

Copyright © www.e-thaksalawa.moe.gov.lk